# රූකඩ නැටුම්

පසුගිය අවුරුදු තුන හතර තුළ අපට රූකඩ නැටුම් විශේෂඥයන් දෙදෙනෙකුගේ උපදෙස් ලබා ගැනීමේ වරය ලැබිණ. හැව්ලිකෝව්ා මැතිණිය පළමු වත් ඉන් පසු වජිත් කෝව්ා මැතිණියත් මෙහි පැමිණ මාස ගණන් ගත කරමින් අපේ රූකඩ කලාව නගා සිටුවීම සඳහා අපේ පරම්පරාගත කලාකරුවනට උපදෙස් දෙමින්, රූකඩ නැටුම් කලාව කෙරෙහි පොදු උනන්දුව උනන්දු කරවමින් කිප තැනක මධ්‍යස්ථාන පිහිටුවීමටද පුරෝගාමී වූහ. මොවුන් දෙන්නා පැමිණියේ අද ලෝකයේ රූකඩ කලාව අතින් ඉතාම දියුණු රටක් වන චෙකොස්ලෝවේකියාවෙනි. එහි රූකඩ කලාව උගන්වනුයේ විශ්ව විද්‍යාලය තත්යෙනි. ප්‍රාග් විශ්ව විද්‍යාලයයේ නාට්‍ය අංශයේ අනුබද්ධ ආයතනයකි රූකඩ නැටුම් අංශය. ලංකාවට පැමිණි මේ විශේෂඥයන් දෙන්නා මෙහි කථිකාචාර්යයෝ වෙති. ඔවුන් අපට කියා දුන්නේ අපේ පරම්පරාගත නූල් රූකඩ වඩා හොඳින් නටවන හැටි පමණක් නොවේ. රූකඩ නැටුම දියුණු රටවල භාවිතා වන දණ්ඩෙන් නටවන රූකඩ, අත් රූකඩ, මේස් රූකඩ ආදී නව අංග ඔවුහු අපට කියා දුන්හ. ඒවා හදන හැටි අපට කියා දුන්හ. අපේ රූකඩ බර වැඩි බව පෙන්නාදී ඒවා කුඩාවට කැපීමේ අවශ්‍යතාව පෙන්වා දුන්හ. රූකඩ නැටුම හුදෙක් කෝනංගි, සෙල්ලපුල්ලේ, නංගිහාමි ආදී චරිත නැටුමට පමණක් සීමා නොවිය යුතු බවත් ඔවුහු පෙන්වා දුන්හ. රූකඩ කලාව දියුණුවීමට නම්, පොදු රසිකයාගේ හිත් ඇද ගැනීමට නම්, නාට්‍යානුසාරයෙන් රූකඩ කලාව ඉදිරිපත් කළ යුතුය. වේදිකාවේ එන චරිත වෙනුවට රූකඩ උපයෝගී කර ගනිමින් නාට්‍ය ඉදිරිපත් කළ යුතු යැයි පෙන්වා දුන්හ. මේ විශේෂඥයෝ ලංකාව පුරා ඇවිදිමින් මධ්‍යස්ථාන කීපයකම මේ උනන්දුව ඇති කිරීමට දිරිගත්හ. අම්බලන්ගොඩ එක් මධ්‍යස්ථානයක් ද, කොළඹ චිත්‍රසේන කලායතනයේ තවෙකක් ද, ලංකා විශ්ව විද්‍යාලයේ තවෙකක් ද, යනාදී වශයෙන් මධ්‍යස්ථාන පිහිටැවිණි. ඔවුන් කළ සේවයේ තරමට අද ලංකාවේ රූකඩ කලාව කොයි තරම් දියුණු අඩියක තිබිය යුතුද?

## අවාසනාව

ඒත් අවාසනාවක මහත. අප රූකඩ අතින් තවමත් කලින් හිටි තැනම යයි කිව යුතුය. වජිත්කෝව්ා මැතිණිය තම සේවා කාලය අවසන් වී යන්නට පෙර, ඇයගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් කොළඹ රාජකීය විද්‍යාලයේදී පෙන්වන ලද සන්දර්ශනයේදී අප තැබූ බලාපොරොත්තු සියල්ලක් අද සුන් වී තිබීම අපේම අවාසනාව විය යුතුය.

ලංකා කලා මණ්ඩලයේ පහතරට නැටුම් අනු මණ්ඩලයේ මෙහෙයීමෙන් පසුගියදා පවත්වන්නට යෙදුණු රූකඩ නැටුම් තරඟය බලා සිටි අපට අනුන් ගෙන් ලැබෙන උදව් වෙන් වත් ප්‍රයෝජන ගැනීමට බැරිවීම කාගේ අවාසනාව දැයි සිතිණ. තරඟයේ එක් අංශයක් වූයේ කෝනංගි, සෙල්ලපුල්ලේ හෝ නංගිහාමි හෝ යන තුනෙන් තෝරා ගත් එක් නැටුමක් ඉදිරිපත් කිරීමයි. මේ තරඟයට විසි දෙනකු පමණ සහභාගිවූ නමුත් තරඟකරුවන් සියලු දෙනාම විසින් ඉදිරිපත් කරන ලැබුයේ අනුන් ගෙන් ඉල්ලාගත් එකම රූකඩයයි. තම තමන්ගේ රූකඩ තනා ගැනීම කෙරෙහි එකෙක් හෝ උනන්දුවී නොතිබිණි. සියළු දෙනාම කළේ එකම රූකඩය එකම විදිහට මෙන් නැටවීමයි. පසුබිමින් ගයනු අසන්නට ලැබුණේද එකම පද මාලාවකි. එකම තාලයකි. බෙර වාදනය කැරුණේද එකකු අතින්මය. නාට්‍ය ඉදිරිපත් කළ යුතුව තිබුණු තරඟයේ අනිත් අංශයේද නාට්‍යයේ අවශ්‍යතාවන් ගැන අවබෝධ කරගත් එක් තරඟකරුවෙක් හෝ නොවීය. වැඩි දෙනකු කළේ කවදාවත් පුරුදු එකම රූකඩ කිහිපයක් වේදිකාවට ගෙන ඒම පමණය. මෙබඳු ඒකාකාර රූකඩ නැටුමකින් රසිකයා නොව සාමාන්‍ය කෙනකු වුව ආස්වාදයක් ලබතියි සිතිය නොහෙයි.

අපට රූකඩ කලාව ගැන උපදෙස් දීම සඳහා අමෙරිකාවේ විශේෂඥවරියක් වන මැක්පාලින් මැතිණිය තව ටික දිනකින් ලංකාවට පැමිණීමට නියමිතය. අඩු ගණනේ ඇයගේ සේවයෙන් වත් යමක් ලබා ගැනීමට අප තැත් කළ යුතුය.

කලින් ආ විශේෂඥයන් දෙන්නා ම නැතින් නැ...

ඉන් අද යමක් කෙරෙනවා පෙනෙන්නට ඇත්තේ ලංකා විශ්ව විද්‍යාලයේ පමණ යි සිතමි. චිත්‍රසේන කලායතනයේ රූකඩ පංතිය දැන් අභාවයට ගොසින් යයි දැනගන්නට ලැබෙයි. අම්බලන්ගොඩ කලායතනයේ දියුණුව පසුගියදා පැවති තරඟවලින් පැහැදිලිවිය. අප කල්පනාවේ හැටියට රූකඩ කලාව නගා සිටුවීමට නම් කළ යුත්තේ කොළඹ වැනි ප්‍රදේශයක එක් මධ්‍යස්ථානයක් පිහිටුවා අධ්‍යාපන පසුබිමක් සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් 25 දෙනකු පමණ බඳවා ගෙන කැනෙන අධ්‍යාපන පසුබිමක් ඇති ගුරුවරයකු හෝ ගුරුන් දෙනූන් දෙනකු හෝ පුහුණු කිරීමයි. මධ්‍යස්ථානයෙන් මධ්‍යස්ථානයට යාමට සිදු වීමෙන් වනුයේ එක් තැනකට දෙනූන් සතියකට

## මධූප විසිති

වඩා කාලය මිඩංගු කිරීමට නොහැකිවීමයි. ඒ වෙනුවට මැක්පාලින් මැතිනියට මෙහි ඉන්නා මුළු කාලය තුළදීම එකම මධ්‍යස්ථානයක් කෙරෙහි අවධානය යොමු කිරීමට හැකි වී නම් බොහෝ දෙනකු අඩවශයෙන් ලබන පුහුණුවට වඩා මිශ්‍ර දෙනකුට සම්පූර්ණ පුහුණුවක් ලැබිය හැකිය. ශ්‍රී ලංකා ජාතික කලායතනය හෝ විශ්ව විද්‍යාලය තුනෙන් එකක් හෝ මේ සඳහා සුදුසු මධ්‍යස්ථානයක් විය යුතුය.

ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් ගුරුවරයනුත් අධ්‍යාපන පසුබිමකින් යුක්තවීම අවශ්‍ය වනුයේ සමාජයේ නූතන අවශ්‍යතා දැනීමේ බුද්ධියක් ඔවුන් තුළ තිබිය යුතු බැවිනි. රූකඩ කලාව වෙනත් රටවල, චෙකෝස්ලෝවෙකියාව, පෝලන්තය, අමෙරිකාව ජපානය ආදී රටවල දක්නට ලැබෙන්නේ ජනකලාවක් වශයෙන් නොව උසස් කලාවක් වශයෙනි. නැටුම් වශයෙන් නොව නාට්‍ය වශයෙනි. එහෙයින් අපට අවශ්‍ය වනුයේ අපේ රූකඩ කලාවට නාට්‍යමය ජීවිතයක් දීමට සමත් උගතුන්ය. මධ්‍යස්ථානය කොළඹ පිහිටුවීමෙන්, කොළඹ මහ විද්‍යාලවලින් ඒ සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලබා ගැනීම පහසු විය යුතුය. ආනන්ද බාලිකා විද්‍යාලයයේ දැනුදු රූකඩ කලාව උගන්වනු ලැබෙයි. ආනන්ද මහා විද්‍යාලයය වැනි ආයතනද මේ ගැන උනන්දුවක් දක්වනු නිසැකය. ජාතික

කලායතනයේ මධ්‍යස්ථානයක් පිහිටුවා සවසපංති පැවැත්වීමට කටයුතු යොදනොත් වැඩේ සාර්ථක කරගත හැකිය. කලායතනයේ සවස පංතිවලට බැඳී සංගීතය හා උඩරට නැටුම් හදාරා සය අවුරුදු පුහුණුවක් අවසන් කළ කොළඹ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එමටය.

## ගොක්කලා

රූකඩ නැටුමින් තවත් ජන කලාවක් වූ ගොක් කලාව ගැන අදහස් දක්වීමේදී උගතුන් මෙබඳු කලාවන්හි වනවාන වීමෙන් එම කලාවන් නගා සිටුවිය හැකි අන්දම පැහැදිලි වෙයි. ගොක් කොළයක් රඹ පතුරක් මෙනුවක් කල් උපයෝගී කරගනු ලැබුයේ තොවිල් පවිල් සඳහා පමණි. නමුත් ගොක් කොළයෙන් ඊට වැඩි අරුමයක් කළ හැකි බව පසුගියදා දක්නට ලැබුණු ගොක් කලා ප්‍රදර්ශනයකදී අපට දැක ගන්නට ලැබිණි. තොවිල් විදිය, බලි රූපය ආදී තොවිලය හා සැබැඳි දේ සැරසිලි කිරීමට ගත් ගොක් කොළය ඊට වැඩි ප්‍රයෝජනයක් සඳහා උපයෝගී කරගෙන තිබෙනු මේ ප්‍රදර්ශනයේදී දැක්ක හැකි විය. මනාලියගේ මල් පොකුරකින් පටන් ගත්තා ගොක් කොළ සැරසිල්ල අවසන් වනුයේ මල්වඩමකිනි. ඒ අතර තුර ගොක් කොළයත්, ඇතැම් විට කොළ පැහැගත් පොල් කොළයත් උපයෝගී කර ගනිමින් තනන ලද පක්ෂීන්, කෑමීන්, සර්පයන්, මෝස්තර, සැරසිලි යනාදී මහා රාශියක් ප්‍රදර්ශන භාණ්ඩ දැක ගත හැකි වෙයි. මඟුල් පෝරුව මෙහිලා පහසුයෙන් හිතට කාවැදෙන්නකි. ගොක් කලාව පොදු රසිකයාගේ මන බඳනා කලාවක් වශයෙන් පුළුල් කොට දියුණු කිරීම කෙරෙහි යොදවන ලද කලාකරුගේ මනස මේවායින් හෙළි වෙයි.

ගොක් කලාව වඩාත් ජනප්‍රිය කිරීමට නම්, දවසින් දෙකෙන් වේලියන ගොක් කොළය වැඩි කලක් තබා ගැනීමට හැකි වන කිසියම් රසායනික ක්‍රමයක් සොයා ගැනීම අවශ්‍ය වනු ඇත. මලින් සැදුණු මල්වඩම්, මල් පොකුරු මෙන් ගොක් කොළයෙන් සැදුණු මෝස්තර මහජනයාට කඩෙන් මිලදීගත හැකි වුවොත් මේ කලාව වඩා පැතිරයනු නිසැකය. මේ සම්බන්ධයෙන් ගොක් කලාව ගැන උනන්දුවක් දක්වන්නවුනට ලංකාද්වීපය (ලංකා කාර්මික හා විද්‍යාත්මක පර්යේෂණායතනය) දෙසට හැරිය හැකි විය යුතුයයි සිතමි.



ඇමෙරිකාවේ එළිමහන් රංග පීඨයක රූකඩ නැටුමක්.

1964 ජුලි මස 23 වෙනි

දවස